ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

<u>කොළඹ</u>

පුවත්පත් නිවේදනය

## කැබිනට් මණ්ඩලය උත්තර් ප්‍රදේශ් හි කුෂිනගර් ගුවන්තොටුපළ ජාත්‍යන්තර ගුවන්තොටුපළක් ලෙස ප්‍රකාශයට පත් කිරීම අනුමත කරයි

2020 ජුනි 24 දින ප.ව. 4.38 දිල්ලි හි පුවත්පත් තොරතුරු කාර්යංශය විසින් පළකරන ලදී.

අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදිගේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් මධ්‍යම කැබිනට් මණ්ඩලය උත්තර් ප්‍රදේශ් හි කුෂිනගර් ගුවන්තොටුපළ ජාත්‍යන්තර ගුවන් තොටුපළක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට අනුමැතිය ලබා දී තිබේ.

කුෂිනගර් ගුවන්තොටුපළ පිහිටා ඇත්තේ ශ්‍රාවස්ති, කපිල්වස්තු, ලුම්බිණි (කුෂිනගර් ද බෞද්ධ සංස්කෘතික ප්‍රදේශයකි) වැනි බෞද්ධ සංස්කෘතික ස්ථාන රැසකට ආසන්නයෙනි. මෙය ජාත්‍යන්තර ගුවන්තොටුපළක් ලෙස ප්‍රකාශයට පත් කිරීම මගින් සම්බන්ධීයතාවය වැඩිදියුණු කෙරෙනු ඇති අතර ගුවන් මගීන්ට තරගකාරී මිල ගණන් සඳහා වඩා පුළුල් අවස්ථාවක් ලබා දෙනු ඇත.එසේම, දේශීය / ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය නංවාලීමට සහ එම ප්‍රදේශයන්හි ආර්ථික සංවර්ධනයටද මෙය ඉවහල් වනු ඇත.

කුෂිනගර් පිහිටා ඇත්තේ උත්තර් ප්‍රදේශ් හි ඊසානදිග කොටසේ ගෝරක්පූර් හි සිට කි.මී. 50 ක් පමණ නැගෙනහිරින් වන අතර එය වැදගත් බෞද්ධ වන්දනා ස්ථානයකි.

******

කොළඹ
2020 ජුලි 14